www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලාංකික වෘත්තීය සමිති නායකයෝ බාටා කම්කරුවන් විකිනීම සූදානම් කරති

## Sri Lankan union leaders prepare to sell out Bata workers

**ඩබ්ලිව්. ඒ. සුනිල් සහ සමන් ගුනදාස විසිනි**
**2004 සැප්තැම්බර් 18**

ශ්‍රී ලාංකික බාටා කම්කරුවන් ඔවුන් ගේ රැකියා රැක ගැනීම සඳහා කටුක අරගලයක් දියත් කර මාස තුනකට ආසන්න වීමෙන් පසුව, වානිජ හා කාර්මික කම්කරු සංගමය (වාකාකස) අරගලය විකුනා දැමීමට සූදානම් වෙයි: කම්කරුවන් 146ක් දොට්ට දැමීමේ එහි මුල් සැලසුම පාලනාධිකාරයට ක්‍රියාවට දැමීමට ඉඩ සලසන වන්දි පැකේජයක් සඳහා ඔවුන්ගේ එකගතාවය වර්ජිත කම්කරුවන්ගෙන් බලෙන් ලබා ගැනීමට වෘත්තීය සමිති නායකයෝ උත්සාහ කරමින් සිටිති.

වෘත්තීය සමිති නායකයන් ''සටන් කිරීමට සූදානම්'' නමුත් කම්කරුවන්ට දුෂ්කරතාවලට මුහුන දීමට සිදු වී ඇති නිසා අරගලය අහවර කිරීමට සිදුවන බව සැප්තැම්බර් 16 රත්මලානේ පැවති කම්කරුවන් 500ක් පමන සහභාගි වූ රැස්වීමක දී වාකාකස නායක ලීනස් ජයතිලක පැවසී ය. අරගලය දුර්මුඛ කර, අවසානයේ දී සමාගමේ සැලැස්ම පිලිගැනීමට කම්කරුවන්ට බල කිරීමේ වෘත්තීය සමිතියේ ද්‍රෝහී ක්‍රියාකලාපය ඔහුගේ ප්‍රකාශයෙන් එලිදරව් විය.

වන්දි සහිතව කම්කරුවන් දොට්ට දැමීමට පාලනාධිකාරය බලාපොරොත්තු වූ නමුදු කම්කරුවන්ව දොට්ට දැමීම නතර කිරීමට අවශ්‍ය වූ නිසා බාටා සමාගම සමග සම්මුතියකට ඉඩක් නැති බව පවසමින් ජයතිලක සිය කතාව ආරම්භ කලේ ය. පාලනාධිකාරය සහ එක්සත් ජනතා නිදහස් සංධාන (එජනිස) ආන්ඩුවේ කම්කරු ඇමති ආතාවුද සෙනෙවිරත්න සමග වෘත්තීය සමිති නායකයන් විවිධ වන්දි සූත්‍ර ගැන සාකච්ඡා කර තිබූ බව ඔහු ප්‍රකාශ කලේ ය. සේවය කල කාලයට සහ විශ්‍රාම යන වයස දක්වා ඉතිරි කාලයටත් වසරකට මසක වැටුප බැගින් ගෙවීමේ ඇමතිවරයාගේ යෝජනාවට සමාගම එකඟ විය. සේවය කල කාලයට සහ වයස 55 සම්පූර්න වීම දක්වා කාලයට වසරකට මාස එකහමාරක වැටුපක් වන්දි වසයෙන් ගෙවීමට සම්මුතියක් ලෙස වෘත්තීය සමිතිය යෝජනා කල බව ජයතිලක පැවසී ය.

වෘත්තීය සමිතියේ යටත් වීම කම්කරුවන්ගේ අධෛර්යමත් වීමේ ප්‍රතිඵලයක් නොවේ. බොරු චෝදනා මත පාලනාධිකාරය වෘත්තීය සමිති නායකයෙකු සේවයෙන් නෙරපූ විට එයට විරෝධය පාමින් ජුලි 22 ඔවුහු කම්හල වාඩි ලා ගත්හ. කම්හල් පරිශ්‍රයෙන් ඉවත් වීම ඔවුන් ප්‍රතික්ෂේප කල විට පාලනාධිකාරය 595ක් වූ සියලුම කම්කරුවන්ව සේවයෙන් ඉවත් කිරීමේ ලිපි නිකුත් කලේ ය. අගෝස්තු 3 කම්කරුවන් බලහත්කාරයෙන් කම්හල් පරිශ්‍රයෙන් ඉවත් කිරීම සඳහා එජනිස ආන්ඩුව සිය ගනනක් ආයුධ සන්නද්ධ පොලීසිය යෙදවී ය. පාවහන් නිෂ්පාදන කම්හලෙන් පිටත ගෙනයාම වැලැක් වීමට මිනිස් බාධකයක් ලෙස ඔවුන් කම්හල් දොරටුව ඉදිරිපිට අගෝස්තු 12 ඔවුන් සිටගත් ගත් විට පොලීසිය යලිත් කම්හලෙන් පිටත දී රුදුරු ලෙස කම්කරුවන්ට පහර දුන්නේ ය. එතැන් පටන් කම්හල තුල පොලීසිය යොදවා ඇති අතර පාවහන් බහාලුම් සහ බාටා නිෂ්පාදන අඛන්ඩව පවත්වා ගෙන යාම සඳහා කම්හල් යන්ත්‍ර සූත්‍ර වෙනත් තැන්වලට ගෙන ගොස් තිබේ.

එහි ''සම්මුති'' සූත්‍රය හරහා කම්කරුවන්ව තල්ලු කිරීමට වෘත්තීය සමිතිය යොදා ගත් කම්කරුවන් රැවටීමේ උපාය ජයතිලකගේ කතාවෙන් එලිදරව් විය. රැස්වීමක දී විවෘතව කම්කරුවන්ගේ අදහස් විමසනවා වෙනුවට, ඔවුන් වෘත්තීය සමිතියේ යෝජනාවට පක්ෂ ද විපක්ෂ ද අසමින් සැම කම්කරුවෙකුටම වෘත්තීය සමිතිය විසින් වෙන වෙනම ලිපි යවා තිබුනි. නමුත් කුමන්ත්‍රනකාරී සැලසුම ආපසු කැරකුනි. මත විමසුමට ප්‍රතිචාරය දැක් වූ කම්කරුවන් 450න් 300ක් සමිතියේ පැකේජයට විරුද්ධ වූ බව ජයතිලක පිලිගත්තේ ය. සෙසු අය තවමත් පිලිතුරු දී නැති අතර 150 සමිතියේ යෝජනාවට එකඟ වූහ. එහෙම වුනත් වෘත්තිය සමිතිය සිය යෝජනාව මත පෙරට යන බව ජයතිලක ඇඟෙව්වේ ය.

සමිති නායකයන් මෙම ක්‍රියාමාර්ගය ගෙන ඇත්තේ කම්හල් පරිශ්‍රය තුල වාඩි ලා ගැනීම, පාලනාධිකාරයට බාධා කිරීම, භාන්ඩ ප්‍රවාහනයට අවහිර කිරීම සහ නීති විරෝධී ලෙස රංචු ගැසීම ඇතුලු පොලීසියේ චෝදනාවලට මුහුන දී සිටින කම්කරුවන් 27ක ගේ ඉරනම ගැන නො තකමිනි. ඔවුන්ට යලි රැකියාව දීමට පාලනාධිකාරය සූදානම් නැති නමුත් ඔවුන්ගේ නඩුවලට සමිතිය මැදිහත් වන බව ජයතිලක පැවසී ය.

රැස්වීමට සහභාගි වූ කම්කරුවෝ වෘත්තීය සමිතියේ ක්‍රියාවන් හෙලා දුටහ. කම්හල තුල වසර 15ක් සේවය කල කාන්තා කම්කරුවෙක් *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* කතා කරමින් මෙලෙස පැවසුවාය: ''රැස්වීමේ උනුසුම් වාද විවාද සිදු වුනා. රැකියාවලට කුමක් සිදු වේ දැයි කම්කරුවන් ඇසුවා. පොලීසිය විසින් නඩු ගොනු කල කම්කරුවන්ගේ ඉරනම කුමක් ද? ඔවුන්

ආපසු වැඩට යාමට අවශ්‍ය බව බොහෝ කම්කරුවන් පැවසුවා: කම්කරුවන් සමිතිය කෙරෙහි නො සතුට ප්‍රකාශ කලා.''

කුමක් කල යුතු දැයි කම්කරුවන් අතර ව්‍යාකූලතාවක් පවතින බව ඇය පැවසුවා ය. වෙනත් වෘත්තිය සමිතියක් සංවිධානය කිරීමට සමහරුන් යෝජනා කරමින් සිටි නමුත් එසේ කිරීම වන්දි පැකේජය ලබා ගැනීමේ ඔවුන්ගේ උත්සාහයට හානිකර වන බවට වාකාකස නායකයෝ අනතුරු ඇඟවූහ.

ඔවුන්ගේ සම්පූර්න පාවා දීම සූදානම් කිරීමේ දී වාකාකස නායකයෝ ''වාම'' පූච්ඡානම් සහ අවස්ථාවාදී ගනුදෙනු සම්බන්ධ ඉතිහාසයක් ඇති පලපුරුදු වෘත්තිය සමිති නිලධරයෙකු වූ ලංකා වෙලඳ කාර්මික සහ පොදු කම්කරු සංගමයේ (සීඑම්යූ) ප්‍රධාන ලේකම් බාලා තම්පෝගේ සේවය ලබා ගෙන ඇත. බාටා පාලනාධිකාරය සහ හාම්පුතුන්ගේ සම්මේලනය සමග සාකච්ඡා පැවැත් වීම ඔහුට පවරා තිබේ.

උප කොන්ත්‍රාත් පිටට දීමෙන් සහ චීනය වැනි ලාබ මූලාශ්‍රයන් ගෙන් කෙරෙන අපනයන ඉහල දැමීමෙන් ශ්‍රී ලංකාව තුල නිෂ්පාදන කටයුතු කප්පාදු කිරීමට බාටා සමාගම තැත් කරමින් සිටියි. වෘත්තීය සමිතිය මත පීඩනය උග්‍ර කිරීම සඳහා එහි සැලසුම්වලින් පසු නො බසින බව පාලනාධිකාරය අවධාරනය කර ඇත. වෘත්තිය සමිති ගත වී නැති කම්කරුවන් 58 දෙනෙක් යොදා ගනිමින් කම්හල යලි විවෘත කර ඇති බව කලමනාකාර අධ්‍යක්ෂ කිම් බ්‍රැඩ්ලි සති දෙකකට පෙර ජනමාධ්‍යවලට පැවසී ය.

බාටා අරගලය පිලිබඳ වෘත්තිය සමිතියේ ආස්ථානය පලල් සහයෝගයක් දිනා ගැනීමට කම්කරුවන්ට ඇති නො හැකියාවේ ප්‍රතිඵලයක් නො වේ. අනෙකුත් වාකාකස ශාඛා සමිතිවලට කැඳවුම් කිරීමක් හෝ අරගලයට සහය දෙන ලෙස සෙසු කම්කරුවන් ගෙන් ඉල්ලා සිටීමත් වාකාකස නායකත්වය කර නැත. එසේ තිබිය දීත් අගෝස්තු 12 පොලිස් ප්‍රහාරයට විරෝධය පෑමට රත්මලාන කාර්මික ප්‍රදේශයේ කම්කරුවෝ සිය ගනනක් ඉදිරියට ආහ. සැප්තැම්බර් 1 පිටකොටුවේ දුම්රියපොල ඉදිරිපිට පැවති තවත් විරෝධතා උද්ඝෝෂනයකට දොට්ට දැමූ බාටා කම්කරුවන්, තරුනයන් ඇතුලු 1500ක් පමන කම්කරුවෝ සහභාගි වූහ. නමුත් සෙසු කම්කරුවන්ගේ සහභාගිත්වය සීමා කිරීමට සමිති නායකයෝ උත්සාහ කලහ.

ආන්ඩුව තුල සිටින ''ප්‍රගතිශීලී පිරිසක්'' බාටා කම්කරුවන්ට සහයෝගය දෙන බවට මිථ්‍යාවක් සටන ආරම්භයේ සිට ම වාකාකස නායකයෝ වගා දිගා කලහ. නමුත් ආන්ඩුව කම්කරුවන්ට එරෙහිව පොලිසිය යෙදවීමෙන් පසුව ඔවුන්ට මෙම බොරුව නඩත්තු කිරීමට නො හැකි විය. එය කම්කරුවන්ගේ ප්‍රශ්න විසඳන බව ජනතා විමුක්ති පෙරමුනත් ඇතුලත් චන්ද්‍රිකා කුමාරතුංග ගේ එජනිස සභාගය අප්‍රේල් මැතිවරනයට පෙර ප්‍රකාශ කලේ ය. නමුත් බලයට පත් වූ වහාම එය මහා ව්‍යාපාරිකයන් කෙරෙහි ඇති එහි කැපවීම ප්‍රදර්ශනය කලේ ය.

දේශීය වෙලඳපොල ආරක්ෂා කිරීම සඳහා පාවහන් ආනයනය නතර කරන ලෙස ද වෘත්තීය සමිතිය ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. මෙම ආරක්ෂනවාදී ප්‍රතිචාරය උදව් කරන්නේ බාටා වැනි සමාගම්වලට විවිධ රටවල කම්කරුවන් එකිනෙකාට එරෙහිව පිහිටුවීමට පමනි රටවල් 68 තුල බාටා කම්කරුවෝ 50,000ක් පමන සිටිති: නමුත් වාකාකස නායකයෝ ඔවුන්ගේ සහයෝගය ඉල්ලා නොසිටිය හ. ඒ වෙනුවට ඔවුහු එක්සත් ජනපද වෘත්තිය සමිති නිලධරය දෙසට හැරී ගත්හ.

ශ්‍රී ලාංකික කම්කරුවන් වෙනුවෙන් ඇමරිකානු කම්කරු සම්මේලනය සහ කාර්මික සංවිධාන පිලිබඳ කොන්ග්‍රසය (ඒඑෆ්එල්- සීඅයිඕ) බාටා සභාපති තෝමස් බාටා ට ආයාචනා කර තිබූ බව ජයතිලක කම්කරුවන්ට පැවසී ය: නමුත් එහි ආයාචනයේ පදනම කුමක් දැයි ඔහු කම්කරුවන්ට නො පැවසී ය. ඇමරිකානු සහ ජාත්‍යන්තර කම්කරු පන්තිය මත ප්‍රහාර එල්ල කිරීමේ දී සංගතවල අධිපතීන් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ඒඑෆ්එල්-සීඅයිඕ නායකත්වය කුප්‍රකට ය.

සටන්කාමී මවා පෑමක් මගින් සමහර වැඩපොලවල සහයෝගය දිනාගෙන ඇති නව සමසමාජ පක්ෂය විසින් වාකාකස පාලනය කරනු ලබයි.

ශ්‍රී ලංකාව පුරාම නො සන්සුන්තාවක් වර්ධනය වීම මධ්‍යයෙහි බාටා අරගලය පැන නැගුනි. වෘත්තීය සමිති හෙලා දකිමින් සහ සුදුසු වැටුපක් ඉල්ලමින් හැටන් සහ මස්කෙලිය වැනි තේ වගා කරන මධ්‍යම ප්‍රදේශවල වතු කම්කරුවෝ මෑත දී උද්ඝෝෂනයක නිරත වූහ. ආන්ඩුවේ සෞඛ්‍ය සේවකයන් ඒ හා සමාන ඉල්ලීම් සඳහා උද්ඝෝෂනයක් ආරම්භ කර ඇති අතර විශ්ව විද්‍යාලවල අනධ්‍යයන සේවකයෝ ඉහල වැටුපක් ඉල්ලමින් වර්ජනයේ යෙදී සිටිති.

නමුත් සෙසු වෘත්තීය සමිති ද ඊට වඩා වෙනස් නැති බව වාකාකස භූමිකාව පෙන්නුම් කර තිබේ. ඔවුන්ගේ ජාත්‍යන්තර සම පාර්ශ්වයන් සමග එකමුතුව ඇතිව කම්කරුවන්ගේ කවර හෝ ස්වාධීන ව්‍යාපාරයක් ඇති වීම වැලැක් වීම කෙරෙහි එහි ක්‍රියාකාරිත්වයන් යොමු වී ඇත. ජාතිකවාදී ක්‍රියාමාර්ගයක් මත පදනම්ව බාටා සමාගම සහ ආන්ඩුව මත පීඩනය යෙදුනු ඇතැයි ඔවුන් ප්‍රකාශ කල විරෝධතා ව්‍යාපාරයක් තුල වාකාකස නායකයෝ කම්කරුවෝ හුදකලා කලහ.

මෙම ක්‍රියාමාර්ගය සහජයෙන් ම බංකොලොත් සහ නිරර්ථක ය. භූගෝලීකෘත නිෂ්පාදන කොන්දේසි යටතේ බාටා වැනි සංගතයන් ඔවුන්ගේ ශ්‍රම බලකාය කප්පාදු කිරීම සහ උපරිම ලාබ සඳහා ලාබ ශ්‍රම නව මූලාශ්‍රයන් සූරාකෑම නිරන්තරව ම කරනු ලබයි. ඊ කියා ඊක ගැනීමේ අව්‍යාජ අරගලයක ආරම්භක ලක්ෂ්‍යය වන්නේ පවතින දේශපාලන රාමුවට කම්කරුවන් බැඳ තබන වර්තමාන වෘත්තීය සමිති නායකත්වයෙන් සම්පූර්න බිඳීමත් සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත ශ්‍රී ලංකාවේ සහ ජාත්‍යන්තර කම්කරු පන්තියේ සෙසු කොටස් වෙතට හැරීම ය.

© www.wsws.org